# ජීවිතයට එක්වරක් ලැබෙන සුමති ටෙලි සම්මානය නිර්මාණය කළ අතුලගේ ගමන් මඟ දෙස බැල්මක්






සුමති ටෙලි උළෙලට උරදුන්නෝ...



ජීවිතයට එක්වරක් ලැබෙන සුමති සම්මානය

## නිහඬ කලාකරුවා

අතුල කල්දෙමුල්ල

මොහොතකට නැවතී ඔබ ජීවත්වන සමාජය දෙස මඳක් බලන්න. නිහඬව බාගත් හිසින් තම මෙහෙවර ඉටු කරමින් සිටිනා මිණි කැට වන් මිනිසුන් ඔබට දැකගන්නට හැකි වනු ඇත. ඔවුහු නොසලිත දියෙන් පිරී පිරුණු කල සේ වෙති. සිය දිවි සැරිය පුරා එක් රැස් කරගත් දැනුම් සම්භාරය පිලිබඳ වචනයකුදු කතා නොකර ඔවුහු තව දුරටත් තමන්ගෙන් සමාජයට ඉටු විය යුතු යුතුකම් කරමින් සිටිති.

එවන් මිනිසකු සමග කළ කතා බහක කෙටි සටහනකි මේ. ඔහු **අතුල උපසිරි කල්දෙමුල්ල** නම් වෙයි. විවිධ කලා මාධ්‍ය ඔස්සේ සිය හැකියාව විශද කළ අතුල වාසය කරන්නේ සිඩ්නි නගරයේ ය.

ඔහු පිළිබඳ නැවතත් සමාජයේ අවදානය යොමු වන්නේ සන්නස පුවත්පත ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ලේඛකයන්ගේ සංසදය සමග සංවිධානය කරන ඩී බී කුරුප්පු අනුස්මරණ කෙටිකතා තරගාවලියේ ජයග්‍රාහකයාට පිදෙන රන් පන්හිඳ සම්මානය නිමවීම නිසා ය. අතුල අතින් නිම වූ ජීවිතයට එක්වරක් ලැබෙන සුමති ටෙලි සම්මානය අදත් සිනමාව සංගීතය හා ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයේ පරිණත වූ දස්කම් දක්වන්නවුන්ට පිදෙනු අපි දකිමු. මේ අතුල සමග ඔහුගේ ගී පද රචනය මුල් කරගනිමින් කළ කතාබහකි. අපි අතුලට සවන් දෙමු.

හංසියේ.... හංසියේ....
කිරෙන් දිය වෙන් කරන්නට හැකි
හංසියේ....
දෙතොල තවරා සොයනු හැකිනම්
මුදු බසක හදවත ඇති විස
හංසියේ....
උකුසියේ උකුසියේ
ගව් ගණන් දුර දකින්නට හැකි
උකුසියේ
දෙනෙත දල්වා බලනු හැකිනම්
එකිනෙකා මුමුණනා ගුණදොස.....
උකුසියේ....
හංසියේ උකුසියේ
ලොවට ඔවුනගෙ සියළු දේ හැර
සොයයි දහසක් නුඹේ ගුණ දොස
දෙතොළ තවරා සොයනු හැකිවෙද
දෙනෙත දල්වා බලනු හැකිවෙද
මුදු බසක හදවතක ඇති විස....

ගායනය : ශ්‍රීලාල් අමරජීව
පදරචනය : අතුල කල්දෙමුල්ල
සංගීතය : දර්ශණ වික්‍රමතුංග

**චිත්‍ර ශිල්පය වගේම ගීත රචනයට පුවත්පත් කලාවට අතුල හුරුවෙන්නේ කොහොමද?**

70 ව දශකය කියන්නේ පාසල් අවධිය. 80 ව දශකයේ තමා නැවුම් අදහස්වලට යමක් කරන්නට පසුබිමක් වැටුණු අවධිය. "**මිහිර ළමා පුවත්පතට** චිත්‍ර හා විශේෂාංගය සපයන්නට ගත්තේ පාසල් අවධියේ ඉඳන්ම. කාලයක් චිත්‍ර **ශිල්පී බන්ධුල හරිස්චන්ද්‍රයන්ගෙන්** චිත්‍ර ඉගෙන ගන්නට යනවා. ඒවගේම දිය සායම් චිත්‍ර කලාවේ ප්‍රමුඛයකු වූ **පී. ඇස්. ප්‍රනාන්දු මහතාගේ** ගුරුහරුකම් ලබනවා. ග්‍රාන්ට් වෙළඳ ප්‍රචාරකායතනයේ චිත්‍ර ශිල්පියෙකු ලෙස 1980 වසරේදී සම්බන්ධ වෙනවා. ඒ කාලය ස්වර්ණමය යුගයක් හැටියට හඳුන්වන්න පුළුවන්. බොහෝ ප්‍රවීනයන්ගේ ඇසුර ලබන්නේ මේ අවධියේදී. සරසවිය සිනමා පුවත් පතේ පිටු සැලසුම් හා විශේෂාංග කරන්නට ලැබෙනවා. එවකට සිටි පුවත් කලාවේදී සිනමාවේ ඉතිහාසය ඔබට ගෙනෙන චිත්‍ර ශිල්පී **ඒ. ඩී. රංජිත් කුමාරයන්ගේ** ඇසුරද මගේ සංධිස්තානයක්. පාසල් යන කාලයේ චිත්‍ර කතා පත්තරවලට චිත්‍ර සැපයුවා. පුංචි මුදලක් ඒ කාලේ හැටියට මට ලැබුණා. "මිහිර" ළමා පුවත්පත වගේම චිත්‍ර කතා පත්තරවලින් කවි සංකල්පනා ඉරිදා හා සතිපතා පුවත්පත්වලට ලිව්වා. කලාවත් එක්ක ගෙවුන අතීතය විනෝදාංශයක් වුනා.

81 වසරේ තමා පළමු ගී පදරචනාව ලියන්නේ. "**ලිපේ ගින්න අඩුවී යනවා**" යන මැයෙන්. මෙහි සංගීතයත් මෑතකදී අපෙන් සමුගත් **තිස්සසිරි පෙරේරා** සංගීතඥයාගේ ගායනය **තිස්ස බණ්ඩාර ජයසුන්දර**. මේ ගීතය තේරුනේ සරළ ගී වැඩසටහන්වලට ලියන්න යාමෙන්. ඒ අවධියේ තිබූ ගීතරචනා බැංකුවට මා ගීත ලියා යැව්වා. **චිත්‍රානන්ද අබේසේකරයන්** මේ ගී තෝරා මට අවස්ථාව සලසා දුන්නා ඉදිරියට ලියන්නට. එයින් තමා **ඩබ්. ඩී. ආරියසිංහගේ "උස් කඳු මුදුනෙන් නැගෙනා බිංදු**" යන ඔහුගේ පළමු ගීය බිහිවන්නේ නව ගායනා වැඩසටහනින්. මෙහි සංගීතය ප්‍රවීනයෙකු වූ **ඩී. ආර්. පීරිස්** මහත්මා අතින් සිදුවන්නේ. මා ග්‍රාන්ට් ප්‍රචාරක ආයතනයේ රැකියාව කරන අතරතුර ගුවන් විදුලි වැඩසටහන්වලට සම්බන්ධ වුනා. කණිටු සරසවිය, සරස්වතී මණ්ඩපය, විද්‍යා සංග්‍රහය වගේ වැඩසටහන් පිටපත් කියවීම් සඳහා **දොස්තර නන්දදාස කෝදාගොඩ,තුසිත මලලසේකරයන්, මර්වින් සේනාරත්නයන්, ගුණරත්න අබේසේකරගේ** වැඩසැටහන්වලට සහභාගී වුනා.




**ඔබ සිතනාකාරයට ගීත රචනා බැංකුවෙන් හා සරළ ගී වැඩසටහන්වලින් පදරචකයින්ට, ගායකයින්ට, සංගීතඥයින්ට සේවයක් වුනාද ?**

සත්තකින්ම ඔව් ! ගීත රචනා බැංකුව කළේ ගීපද රචනාවල ගුණ දොස්, ප්‍රමිතිය සොයා බලා ඒවා තෝරාබේරාගෙන අවස්ථාවක් දෙනඑක. උඩින් පල්ලෙන් තෝරාගෙන කාටවත් අවස්ථාව දුන්නේ නැහැ. ඒවගේම තමා සරළ ගී ශිල්පීන් වැඩසටහනක් ලබා ගන්නේ බොහෝ උත්සාහයක යෙදිලා. අදත් හොඳ ගී ලියැවෙනවා. ඒවා එක් එක් තැන අතරමං වෙනවා. මුදලක් වියදම් කළොත් තමා ඒවාටත් තැනක් ලැබෙන්නේ. අසාර්ථක නිර්මාණවලින් සාර්ථකත්වයක් බලාපොරොත්තු වෙන නිර්මාණ කරුවන් ඉන්නවා. ඒ අයට අවබෝධයක් නැහැ තමන් කුමක්ද කරන්නේ යන වග. ඒවා කොතෙක් දුරට පවතිනවාද කියලා තීරණය කරන්නේ සහෘද රසික ජනතාවම තමා.

**පසුගිය අවුරුදුවල ලියැවුණ ගීත ගැන සඳහන් කළොත්**

මම ගීත ගොන්නක් රචනා කරළා නැහැ. නමුත් ලංකාවේ පළමු සාෆ් ක්‍රීඩා උළෙලෙදී ගීත රචනා අංශයෙන් මා ජයග්‍රහණය කලා. ඒ ගීය ගැයුවේ **අයිවෝ ඩෙනිස්** මහත්මයා. ඒ වගේම **බී. සිරිතුංග පෙරේරාගේ "ගව්වෙන් ගව්ව" ටෙලිනාට්‍යයේ තේමා ගීතය** නිර්මාණය කළා මීට අවුරුදු ගණනකට පෙර. එහි ගායනය **එච්වඩ් ජයකොඩි**. සංගීතය **ඩයමන් පෙරේරා**. **විශාරද ගුණදාස කපුගේ** මහතා සංගීතය හා ගායනය කරන "**විල ලස්සනයි සුවඳැති මල් පිපුණාම**" වගේ තවත් පද රචනයක්. ඒ විශේෂයෙන් නිර්මාණය වුණේ **ලංකා බැංකුවේ ආරාධනා ස්වර දැහැන** වැඩසටහනට. වෙළඳ ප්‍රචාරක ගීතද බොහොමයක් ලියා තිබෙනවා.

**මේරියන්** ගායන කණ්ඩායමේ **නලින් පෙරේරා** ගායනා කරන සුන්දරයි සුන්දරී, ආවර්ජනා, ඔයයි කියා දුන්නේ වැනි ගීතද මේ අතර වෙනවා. ඔයයි කියා දුන්නේ ගීතය තනුව හා සංගීතය සිඩ්නි හි වෙසෙන **අග්‍රා ප්‍රේමරත්නයන්** ගේ නිර්මාණයක්.

මේ අතරට ඉන්දු ප්‍රේමතිලක, ෂෙහාන් නොයෙල්, රුක්ෂාන් මාක්, ටිරෝන් මද්දුමගේ, ජීවන් හඳුන්නෙත්ති, බොනී ප්‍රනාන්දු, ශ්‍රීයානි අබේනායක, තුෂාර ලේකම්ගේ වැනි ශිල්පීන් ද මගේ රචනාවන් ගායනා කර තිබෙනවා.

**මෑතකදී ලියැවෙන "හංසියේ " ගීතය ඔබ සමාජයේ දැනුවත් කරන්නේ මොනයම් ආකාරයටද ?**

ඇත්තටම මෙයින් සමාජය දැනුවත් කිරීමකට වඩා කරන්න බලන්නේ තරුණියට දෙන අවවාදයක් ආකාරයෙන්. යමෙකුගේ හිතේ සැඟවිලා තියෙන විස කියන දේ දෙතොල මත සිප ගැන්මකින් තේරෙන්නේ නැහැ. ඒ වගේම තමා සමාජයෙන් පළමුවැනි චෝදනාව එල්ල වන්නේ ගැහැනියට යන වග.

මේ ගීය සාර්ථක කරගන්නට **විශාරද දර්ශන වික්‍රමතුංගගේ** සංගීතයත්, **ශ්‍රීලාල් අමරජීව ෆොන්සේකාගේ** ගායනයත් එකතු වුණා. මේ ගීතයේ ගායන ශිල්පියා මුණ ගැහෙන්නේ මූණු පොතෙනි. ඔහු වාසය කරන්නේ කැනඩාවේ. ශ්‍රී ලාල්ගේ මිහිරි වූ හඬ මට අළුත් පදරචනාවකට ඇරයුම් කළා. එහෙමයි "**හංසියේ** " ගීතය රචනා වෙන්නේ.

**චිත්‍ර ශිල්පී ආභාෂයෙන් වෙළඳ ප්‍රචාරක මාධ්‍යයට ගෙනදුන් ආලෝකය කොතරම්ද ?**

මම කලා අධ්‍යක්‍ෂවරයෙකු ලෙස ෆීනික්ස් ඔගිල්වි ආයතනයේ සේවය කළා. වෙළඳ දැන්වීම් ප්‍රචාරක කටයුතු වගේම ලංකාවේ බොහොමයක් නිල ලාංඡන මා අතින් නිර්මාණය වී තිබෙනවා. ඒ අතරට **සේවක අර්ථසාදක අරමුදල** හා "**සිරස**" ගුවන් විදුලි ලාංඡනයත් "**විදුර**" ළමා ගුවන් විදුලි ලාංඡනයත් ඇතුලත් වෙනවා. ඒ වගේම ජීවිතයට එක්වරක් ලැබෙන සුමති ටෙලි නාට්‍ය සම්මානය ද මා අතින් නිමවූවක්. මේ ආ මග සතුටු වන්නට මේ ස්වල්පය මට හොඳෙටම ඇති. ඉදිරියේදී නවතම ගීත කිහිපයක් එළි දකිනවා. ප්‍රමාණයට වඩා නිර්මාණාත්මක ගුණය වැඩි දෙයක් කරන්න යන්න තමා අරමුණ. ඉතිං අපි ගිහින් බලමු.

සංවාද සටහන **ජගත් ජේ එදිරිසිංහ**